සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 07 | විෂය / பாடம் / Subject | නාට්‍ය හා රංග කලාව | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 2යි |

නම / பெயர் / Name ..................................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..........................

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ඓතිහාසික කතාවක් අන්තර්ගත වේදිකා නාට්‍යයක් වන්නේ,
   i. මනමේ. ii. තාරාවෝ ඉගිලෙති.
   iii. ගජමන් පුවත. iv. නරිබෑණා.

02. කිසියම් බැරෑරුම් අවස්ථාවකට මුහුණ දුන්විට සිය පාලනයෙන් තොරව සිදුවන ප්‍රතික්‍රියා නිරූපණය කිරීම හඳුන්වන්නේ,
   i. සාත්ත්වික අභිනය නමින් ය. ii. ආහාර්ය අභිනය නමින් ය.
   iii. වාචික අභිනය නමින් ය. iv. ආංගික අභිනය නමින් ය.

03. කදුරු ලී, රුක්අත්තන ලී වැනි සැහැල්ලු ලී වර්ග භාවිත කරමින් නිර්මාණය කරන්නේ,
   i. ඉන හැඩය යි. ii. වෙස් මුහුණු යි. iii. කඩුව යි. iv. හිස් පළඳනා යි.

04. රාත්‍රී කාලයේ සාමාන්‍ය මිනිසෙකු සේ වෙස්වලා ගෙන පෞද්ගලිකවම රටේ ජනතාවගේ ප්‍රශ්න විසඳූ රජ කෙනෙක් ලෙස සඳහන් වන්නේ,
   i. කාවන්තිස්ස රජු ය. ii. බුද්ධදාස රජු ය. iii. රාජසිංහ රජු ය. iv. ගජබා රජු ය.

05. නාට්‍ය ගීත ගායනා කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ,
   i. ඉතා මිහිරි කටහඬක් තිබිය යුතුම ය.
   ii. නාද මාලාවට අනුව නිවැරදිව ගායනා කළ යුතුවීම ය.
   iii. ඊට අදාළ චලන ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය නොවීම ය.
   iv. නාට්‍ය ගීතය අධ්‍යයනය කිරීම වැදගත් නොවීම ය.

• නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

06. .......................................................... යනු ආනුෂංගික කලාවකි.

07. චරිතයක් රංගනය කිරීමේදී .......................................................... මනාව සිදු කළ යුතු ය.

08. ක්ෂණික නිරූපණ මගින් .......................................................... වර්ධනය වේ.

09. කතාවක එක සිද්ධියක් හෝ ඉවත් කළ විට එම කතාවේ .......................................................... බිඳී යයි.

10. වෙස් මුහුණු පැළඳ ගැනීම තුළින් .......................................................... ඇති සිසුන්ට රංගනය පහසු කරයි.

(නිර්මාණශීලී චින්තනය, සබකෝලය, වේෂභූෂණ, ඒකාබද්ධතාව, හැඟීම් ප්‍රකාශනය)

• ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති වාක්‍ය නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යොදන්න.

11. සෙල්ලම් ගෙවල් සෑදීමේ ක්‍රියාවලියේ අනුකරණය හා සමාරෝපය වැනි නාට්‍යමය ලක්ෂණ දක්නට ඇත. (............)

12. නාට්‍යෝචිත අවස්ථාවක කුතුහලය දක්නට ලැබේ. (............)

13. වෙද පුටුව රංග ක්‍රීඩාවකි. (............)

14. රූපවාහිනී නාට්‍යයක් රූපගත කිරීමේදී සිද්ධීන් අනුපිළිවෙලින් පටිගත කිරීම අවශ්‍ය වේ. (............)

15. රංගන කාර්යයේදී සියලු චලන සිදු කරන්නේ කය හා සිරුර උපයෝගී කර ගනිමිනි. (............)

• අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුරු සහිත තීරුව තෝරා එම තීරුවට අදාළ අක්ෂරය හිස්තැන මත ලියන්න.

| A | B | C | D | E |
|---|---|---|---|---|
| කුඩාපොළ හාමුදුරුවෝ | මහකලා හටන | මහාවංශය | දෝන කතිරිනා | සිරි පැරකුම් |
| මද්දුම බණ්ඩාර | මොණරවිල | දීපවංශය | දෙවැනි මහින්ද | මහින්දාගමනය |
| ගැමුණු කුමරු | රාවණා | චූලවංශය | සුබ සහ යස | සිරිදළදාගමනය |

16. ඓතිහාසික කතා රැගත් චිත්‍රපට ඇතුළත් තීරුව වන්නේ .......................................................... ය.

17. ඓතිහාසික කතා ඇසුරින් නිර්මිත ටෙලිනාට්‍ය අඩංගු තීරුව වන්නේ .......................................................... ය.

18. අතීතයේ විසූ දේවියක් හා රජවරු දෙදෙනෙක් පිළිබඳ කතා පුවත් රැගත් වේදිකා නාට්‍ය ඇතුළත් තීරුව වන්නේ .......................................................... ය.

19. ඉතිහාසයේ විසූ වීර චරිත පිළිබඳ අඩංගු තීරුව වන්නේ .......................................................... ය.

20. ශ්‍රී ලංකාව හා සම්බන්ධ ඓතිහාසික කතා අන්තර්ගත ග්‍රන්ථ ඇතුළත් තීරුව වන්නේ .......................... ය.

(ලකුණු 20 x 1 = 20)

## II - කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

01. "අමර ගියා දිව්‍ය ලෝකේ" නාට්‍ය පෙළ ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මෙම නාට්‍යයේ අධ්‍යක්ෂවරයාගේ නම කුමක්ද? (ල. 2)

(ii) මෙම නාට්‍යයෙන් ඉදිරිපත් වන තේමාව කුමක්ද? (ල. 2)

(iii) මෙහි එන නාට්‍යමය අවස්ථා හතරක් නම් කරන්න. (ල. 2)

(iv) මෙම නාට්‍යයේ ප්‍රධාන චරිතයේ චරිත ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල. 2)

(v) මෙම නාට්‍යයේ භාෂා භාවිතය පිළිබඳ කරුණු දෙකක් සඳහන් කරන්න. (ල. 2)

02. (i) නාට්‍යය සංවාද භාවිත කිරීම අයත් වන්නේ කුමන අභිනයට ද? (ල. 2)

(ii) නාට්‍යයක පෙළක සංවාදවල වැදගත්කම කරුණු දෙකකින් සඳහන් කරන්න. (ල. 4)

(iii) නාට්‍යයක සංවාද භාවිතයේදී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න. (ල. 4)

03. (i) නාට්‍යෝපකරණ යන්න පැහැදිලි කරන්න. (ල. 2)

(ii) සාමාන්‍ය උපකරණ හා නාට්‍යෝපකරණ අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ල. 4)

(iii) නාට්‍යයක් සඳහා නාට්‍යෝපකරණ නිර්මාණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියා දක්වන්න. (ල. 4)

04. (i) රංග භූමිය යනු කුමක්ද? (ල. 2)

(ii) ඔබ දන්නා රංග භූමි වර්ග දෙකක් නම් කරන්න. (ල. 4)

(iii) රංග භූමියක ලක්ෂණ හතරක් ලියා දක්වන්න. (ල. 4)

05. ඔබ දන්නා ඉතිහාස කතාවක නාට්‍යමය අවස්ථාවක් තෝරා ගෙන සංවාද හා රංග විධාන සහිතව කෙටි නාට්‍ය පිටපතක් රචනා කරන්න. (ල. 10)